මාධ්‍ය නිවේදන අංක 22

# මැතිවරණ කොමිෂන් සභාව

## මාධ්‍ය නිවේදනය

හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු මෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති ධූරය හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ධූරය ද ඉසිලූ ප්‍රියන්ත පෙරේරා මහතාගේ අභාවය පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව සාතිශය සංවේගයට පත්විය. එවකට මැතිවරණ කොමසාරිස්වරයා වෙත, මැතිවරණ කොමිෂන් සභාව සතුව දැනට පවතින බලතල නොමැති වකවානුවක පවත්වනු ලැබූ පළාත් සභා ඡන්ද විමසීම්, ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මහ මැතිවරණය වැනි මැතිවරණවල දී විනිසුරු ප්‍රියන්ත පෙරේරා මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ධූරය දරමින් එම බලතල හා කාර්ය මණ්ඩලය එකී මැතිවරණ නිදහස්ව හා සාධාරණ ලෙස පැවැත්වීමට යොදවා ගත් ආකාරය ඉතා නිර්මාණශීලි හා අද්විතීය විය. වසර ගණනාවකට පසුව පැවැත්වූ උතුරු පළාතේ පළාත් සභා ඡන්ද විමසීමේ දී යාපනය, කිළිනොච්චි, මුලතිව් දිස්ත්‍රික්ක පමණක් නොව ඩෙල්ෆ් දූපත වැනි ස්ථානවල පවා ඡන්ද විමසීම් නිරීක්ෂණය සඳහා ස්වකීය කාර්ය මණ්ඩලය යෙදවූ අතර, මැතිවරණවල දී රාජ්‍ය නිලධාරීන් විසින් යම් දේශපාලන පක්ෂයකට හෝ අපේක්ෂකයකුට පක්ෂපාතීව හෝ අගතිගාමීව ක්‍රියා කරන විට දී ඔවුන් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවට නිරතුරුවම කැඳවමින් එම කටයුතු අධීක්ෂණය කරමින්, එම සාවද්‍ය ක්‍රියා වැළැක්වීමට උපදෙස් සහ විවිධ නියමයන් කරමින් කටයුතු කළ ආකාරය ඉතා ප්‍රශංසනීයය. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ජනතාව සඳහා තීරණ ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට ඔහු කිසිවිටෙකත් පසුබට නොවූ බව ද, සාධාරණය වෙනුවෙන් කොන්දේසි විරහිතව පෙනී සිටි බව ද ගෞරවයෙන් සිහිපත් කළ යුතු ය. ඔහුගේ අභාවය යහපත් සමාජයක් අපේක්ෂා කරන සියලුදෙනාගේම හදවත් තුළ රික්තයක් ඇති කරනු ලැබ ඇති අතර, ඔහුගේ දියණිය හා ඥාති හිතමිත්‍රාදීන් වෙත මැතිවරණ කොමිෂන් සභාව ශෝකය පළ කර සිටී.

නිමල් පුංචිහේවා

නිමල් ජී. පුංචිහේවා
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2021 සැප්තැම්බර් මස 09